**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය**

DCS/DG/PRESS TEL: 0112877959 FAX: 0112147447 2016.04.28

# මාධ්‍ය නිවේදනය

**පරිගණක ආශ්‍රිත සම්මුඛ පරීක්ෂණ ක්‍රමය මගින් නිල සංඛ්‍යාති පිළියෙල කිරීම**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පිළියෙල කරනු ලබන, විවිධ සමාජ ආර්ථික සහ ප්‍රජා විද්‍යාත්මක සංඛ්‍යාති, ශිෂ්‍යයින්, පර්යේෂකයින්, සැලසුම් සම්පාදකයින් සහ අන්තර්ජාතික ආයතන වැනි විශාල පරාසයක දත්ත පරිහරණය කරන්නන් සඳහා ලබා දෙනු ලැබේ. මෙම නිළ සංඛ්‍යාති සංගණන, සමීක්ෂණ හා පරිපාලන වාර්තා මගින් දෙපාර්තමේන්තුව විසින් පිලියෙළ කරනු ලබයි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින්, ටැබ්ලට් පරිගණක උපයෝගි කර ගනිමින් සම්මුඛ පරීක්ෂණ පවත්වන මොහොතේදීම දත්ත පරිගණක ගත කිරීමේ ක්‍රමවේදය (Computer Assisted Personal Interviewing (CAPI)) සඳහා නව ව්‍යාපෘතියක් ආරම්භ කොට ඇත. මේ මගින් දත්ත එක්රැස් කිරීම සඳහා කඩදාසි උපයෝගි කරගනිමින් උපලේඛන සකස් කර දත්ත එක්රැස් කිරීම වෙනුවට, පරිගණකයේ යතුරු පුවරුව හරහා සම්මුඛ පරීක්ෂණය සිදුකරන විටදීම දත්ත ඇතුලත් කිරීමට හැකියාව ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පවසා සිටින්නේ, මෙම ක්‍රමය මගින් කඩදාසි භාවිතයෙන් තොරව සමීක්ෂණ සඳහා දත්ත එක්රැස් කිරීමට හැකියාවක් ලැබෙන අතර, ප්‍රමාදයකින් තොරව තොරතුරු ප්‍රකාශයට පත් කිරීමේ හැකියාව ලැබෙන බවයි. මෙම නව ව්‍යාපෘතියේ සමාරම්භක උත්සවය 2016 අප්‍රේල් මස 28 වන දින පෙ.ව. 10.00ට බත්තරමුල්ල, වෝටර්ස්එජ්, හෝටලයේදී, කොරියානු සංඛ්‍යාලේඛන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්, වැන්ග්සන් චෝ මහතා ඇතුළු නිලධාරින් පිරිසකගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුනි. තවද, මෙම සමාරම්භක උත්සවය සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය ඒ.ජේ. සතරසිංහ මහතා ඇතුළු දෙපාර්තමේන්තු නිලධාරින්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ නිලධාරින් සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ නිලධාරින් සහභාගි විය තවද, එදින ප්‍රධාන ආරාධිත දේශනය පවත්වනු ලැබුවේ කොළඹ විශ්ව විද්‍යාලයේ සංඛ්‍යාලේඛන අංශයේ, අංශ ප්‍රධානි ආචාර්ය දිල්හානි ආටිගල මහත්මියයි.

2017 වසරේදී පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණයේ, නියමු සමීක්ෂණයක් ලෙස මෙම නව ක්‍රමය හඳුන්වා දීමට අදහස් කර ඇත. මෙම ව්‍යාපෘතිය, කොරියානු ජනරජයේ, ජාතික සංඛ්‍යාලේඛන කාර්යාලයේ ආධාර මත ආරම්භ කොට ඇති අතර, 2014- 2016 තුල මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

මෙම ව්‍යාපෘතිය යටතේ, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ, සංඛ්‍යාන දත්ත කලමණාකරණය සහ සේවා පද්ධතිය (Lanka SIS ) 2014 වසරේදි ස්ථාපිත කරන ලදී. තවද, සංඛ්‍යාන පුහුණු කටයුතු වැඩි දියුණු කිරීම සඳහා 2015 වසරේදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සඳහා නවීන පරිගණක විද්‍යාගාර 2ක් මෙම ව්‍යාපෘතිය යටතේ ලබා දී ඇත. 2016 වසරේ මෙම ව්‍යාපෘතියෙහි තේමාව වී ඇත්තේ තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් නිල සංඛ්‍යාතීන්හි ගුණාත්මක භාවය හා කාලීන භාවය ඉහල නැංවීමයි.

අචාර්ය ඒ. ජේ. සතරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව